# නර්තනය

## 11 ශ්‍රේණිය

(01) නිපුණතාව 7.0

<u>ප්‍රාසංගික නර්තන අංගයන් නිර්මාණය කිරීම.</u>

"වාසනා දිනෙකි මේක" ගීතයට නර්තන නිර්මාණය

පද රචනය :- ජෝන් ද සිල්වා ඇතුළු කණ්ඩායම.

වාසනා දිනේකි මේක හාමු තුමින් සිතේ //
හාමු තුමින් නටමු මේ ලී දරා අතේ //
කෝමල මධුර බසින් මේ ගී
සාදා පවසමු දැන් ....
නටමු පෙළි පෙළි ගැසී - රජිඳා තුමු වාග මෙන්
සිරියා වාසය වේ - ආශා වී සැදුනි //
තේජසා නිබේය දීපේ - ආලෝක වී අපේ
තේජසා නිබේය දීපේ - ආලෝක වී
ආලෝක වී රජිඳු - බෝ ප්‍රීති වී අපි //
තේජසා නිබේය දීපේ ....

නට නට සංතෝෂී නාද දීමෙනි යමු හාරේ
'තුන්' චිදී බොහෝ සේ සදහත් ලක වැජඹේවා //
නිත්‍යා නිරෝගී වේවා - රාජා මේ සිංහලේ //
වාසනා දිනේකි මේක හාමු තුමින් සිතේ
වාසනා දිනේකි මේක හාමු තුමින්

ඉහත සඳහන් ගීතය නූර්ති ශෛලියට අයත් ශ්‍රී වික්‍රම නූර්තියේ ගීතයකි. මෙම ගීතය රජු පිනවීම උදෙසා ගායනා කරන ලද ගීතයකි. ශ්‍රී වික්‍රම නූර්තියේ කන්නසාමි කුමාරයා ශ්‍රී වික්‍රම

නමුත් රජවීමේ ශ්‍රීත්‍ය නිමිත්තෙන් රාජ වාසලේ ගොහොම්මාලු අඹුල් පිරිස රාජ සභාවට විත් රජ පිනවීම උදෙසා රජුගේ ගුණ ගායනා කරමින් ගායනා ලද ගීතයකි. මෙම නූර්ති ගීතයේ රජ වාසලේ නර්තන කණ්ඩායම ලී දෙකක් අතට ගෙන ලී කෙළි නර්තනයක ස්වරූපයෙන් නර්තනයේ යෙදී ඇති බව විද්‍යාමාන වේ.

නර්තන අංගය නිර්මාණයේ අරමුණු:-

* මෙම නිර්මාණයේදී පුද්ගලයාගේ සහජ ළැදියාවන් අනාවරණය කිරීම නිරූපණය කිරීම, ශක්තීන් දියුණු කිරීම.
* ආත්ම ප්‍රකාශනයට යොමු වූ ඇති සහජ ළැදියාවන්ට මං පෙත් සැලසීම.
* සාමූහිකත්වයෙන් මිදී නිර්මාණාත්මක චින්තන ශක්තිය වර්ධනය කිරීම.

නර්තන නිර්මාණයේදී සැලකිය යුතු කරුණු

* ගීතය හොඳින් ශ්‍රවණය කර ගායනා කරන්න.
* තාලය, රිද්මය, ප්‍රකාශනය පිළිබඳ අවධානය යොමු කරන්න.
* නර්තන නිර්මාණයේදී උචිත චලන, අවකාශ භාවිතය දිශා, තාල, රටා, පිළිබඳ අවධානය යොමු කරන්න.
* මෙම ගීතය හොඳින් ශ්‍රවණය කර, ප්‍රස්තුතය පිළිබඳ අවබෝධයෙන් හා ගීතය කට පාඩම් කර ගැනීමෙන් නර්තන නිර්මාණයේ ප්‍රසාංගික -ත්වය මනාව සකසා ගත හැකිය.